ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක : HRC/P/i/S/15/06/23

# මාධ්‍ය නිවේදනය

2021 වසරේ ශ්‍රී ලංකාව ආසන්න මුහුදේ දී එක්ස්ප්‍රස් පර්ල් (X-Press Pearl) නෞකාව අනතුරට ලක්විය. එම අනතුර හේතුකොට ගෙන සිදුවී ඇති අයිතිවාසිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. මෙම පරීක්ෂණයේ පැමිණිලිකාර පාර්ශවයන් ලෙස ආචාර්ය අජන්තා පෙරේරා මහත්මිය සහ පරිසර යුක්ති කේන්ද්‍රය කටයුතු කරනු ලැබේ.

එහිදී මෙම සිදුවීම හා සම්බන්ධයෙන් වගකීම් දරණ, නියාමන බලතල හිමිකම් කියූ සහ යම් ආකාරයකින් සම්බන්ධයක් පවතින සියලු ආයතන වෙතින් ප්‍රකාශයන් සටහන් කරගන්නා ලදී. ඒ අනුව මෙම පරීක්ෂණයට අදාළව මූලික විමර්ශන කටයුතු මේවන විට අවසන් කර ඇත. මෙම පැමිණිල්ලට අදාළව නිර්දේශයන් එළඹෙන ජූලි මාසයේ මුල් සතිය තුළ නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.06.15